*සැ. යු.* - 2024.12.27 වැනි දින පළ කරන ලද අංක 2417 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,418 - 2025 ජනවාරි මස 03 වැනි සිකුරාදා - 2025.01.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | 02 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | 05 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජනවාරි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම ගැසට් පත්‍රය *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

01 - B 082643 — 5,403 (2025/01)
F 1 -

# පළාත් සභා නිවේදන

**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

ලියාපදිංචිය අවලංගු කිරීම

මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් අමිල නවරත්න වන මා මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 50(ආ) වගන්තිය අනුව පහත සඳහන් සමුපකාර සමිතිවල ලියාපදිංචිය අවලංගු කිරීමට තීරණය කර ඇත.

| අ. අ. | සමිතියේ නම | දිස්ත්‍රික්කය | ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය |
|---|---|---|---|---|
| 1 | සීමාසහිත පරිසර හා මානව සම්පත් සමුපකාර සමිතිය | මාතලේ | - | - |

ඉහත නම් සඳහන් සමිතිවල ලියාපදිංචිය අවලංගු කිරීම සම්බන්ධව යම් විරෝධතාවයක් ඇතොත් ඒ බව මෙම දැනුම් දීම පලවී පළමු මාස දෙක ඇතුළත පහත සඳහන් ලිපිනයට මා වෙත දැන්විය යුතුය. ඉන් පසු කෙරෙන ඉල්ලීම් ගැන සලකා බලනු නොලැබේ.

අමිල නවරත්න,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමිති රෙජිස්ට්‍රාර්,
මධ්‍යම පළාත.

2024 දෙසැම්බර් මස 27 වැනි දින,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 02, ඇහැලේපොල කුමාරිහාමි මාවත,
බෝගම්බර,
මහනුවර.

01-11

---

**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

ඈවරය අවසන් කිරීම

මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් අමිල නවරත්න වන මා හට මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 57(2) වගන්තිය අනුව පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සමුපකාර සමිතිවල ඈවර කටයුතු අවසන් බව දන්වා සිටිමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් හෝ හිමිකම් පෑමක් වෙතොත් මෙම දැන්වීම් පළවී මාස 03ක් ඇතුළත මා වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සලස්වන මෙන් දන්වා සිටිමි.

අමිල නවරත්න,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමිති රෙජිස්ට්‍රාර්,
මධ්‍යම පළාත.

2024 දෙසැම්බර් මස 27 වැනි දින,
මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 02, ඇහැලේපොල කුමාරිහාමි මාවත,
බෝගම්බර,
මහනුවර.

| අ. අ. | සමිතියේ නම | දිස්ත්‍රික්කය | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය |
|---|---|---|---|---|
| 1 | සීමාසහිත හඟුරන්කෙත ඉදිකිරීම් කම්කරු සමුපකාර සමිතිය | නුවරඑළිය | මපස 14 | 1990.09.14 |
| 2 | සීමාසහිත ස්ටොක්හෝම් රාජ්‍ය වතුයායේ පාරිභෝගික සමුපකාර සමිතිය | නුවරඑළිය | මපස 210 | 1991.06.05 |
| 3 | සීමාරහිත මොරගොල්ල ශ්‍රී පැරකුම් සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | නුවරඑළිය | නු 375 | 1988.10.02 |
| 4 | සීමාරහිත ලිපකැලේ සත්‍යා  සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | නුවරඑළිය | මපස 522 | 1995.11.16 |

01-12

---

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියේ සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 53(1) වගන්තියේ (ආ) වගන්තියේ (ආ) ඡේදය යටතේ කරනු ලබන දැන්වීමයි.

ලියාපදිංචිය අවලංගු කර ඈවර කටයුතු සිදු කෙරෙමින් පවතින මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ පහත නම් සඳහන් සමුපකාර සමිති වලින් එකී සමිති සමග ගණුදෙනු පැවැත්වූ සියලු සාමාජිකයින්, නිලධාරීන්, සේවකයින් සහ සාමාජික නොවන්නන් හා ආයතන වෙත අයවීමට ඇති මුදල් සම්බන්ධව හිමිකම් කැඳවනු ලැබේ. ඒ අනුව හිමිකම් ඉදිරිපත් කිරීම පහත දැක්වෙන ආකෘති පරිදි පිළියෙල කළ ඉල්ලුම් පත්‍රයක් මගින් සිදුකළ යුතු අතර, එකී ඉල්ලුම්පත් 2025.03.27 වැනි දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් ඈවරකරු වෙත එවිය යුතුය. එසේ නැතහොත් පහත සඳහන් ලිපිනයේ දී හමුවී භාරදිය හැකිය. 2025.03.27 වැනි දිනට පසු ඉදිරිපත් කරනු ලබන හිමිකම් පෑම සම්බන්ධව සලකා නොබලන බව තවදුරටත් සඳහන් කර සිටිමි.

අමිල නවරත්න,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
රෙජිස්ට්‍රාර්,
මධ්‍යම පළාත.

2024 දෙසැම්බර් මස 27 වැනි දින,
මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 02, ඇහැලේපොල කුමාරිහාමි මාවත,
බෝගම්බර,
මහනුවර.

| අ. අ. | සමිතියේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය | ලියාපදිංචිය අවලංගු කළ දිනය | ඈවරකරුගේ නම |
|---|---|---|---|---|---|
| 1 | සීමාරහිත කොණ්ඩතැන්න ඉහලගම්මැද්ද සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | නු 362 | 1987.05.05 | 2024.05.03 | ඩී. එම්. එස්. එම්. දිසානායක මෙනෙවිය |
| 2 | සීමාරහිත හැගම සිද්ධාර්ථ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | නු 384 | 1988.08.03 | 2024.08.16 | ඩී. ටී. පී. සේරසිංහ මයා |
| 3 | සීමාරහිත ගෝඩන් කලෙයිමගල් සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | මපස 277 | 1992.04.29 | 2024.08.16 | ඩී. ටී. පී. සේරසිංහ මයා |
| 4 | සීමාසහිත හැරින්ටන් වතු නිවාස සමුපකාර සමිතිය | සිපිසි 734 | 2004.01.26 | 2024.08.16 | ඩී. ටී. පී. සේරසිංහ මයා |

| අ. අ. | සමිතියේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය | ලියාපදිංචිය අවලංගු කළ දිනය | ඈවරකරුගේ නම |
|---|---|---|---|---|---|
| 5 | සීමාරහිත කලගන්වත්ත සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | නු 352 | 1986.12.30 | 2024.08.16 | ඩී. ටී. පී. සේරසිංහ මයා |
| 6 | සීමාරහිත කොල්ලල්පිටිය උදාර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | මපස 259 | 1992.02.13 | 2024.08.16 | ඩී. ටී. පී. සේරසිංහ මයා |
| 7 | සීමාරහිත බන්ගලා ඩිවිෂන් භාරති සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | නු 392 | 1989.05.18 | 2024.05.03 | බී. ජී. එස්. ඒ. මධුරංග මයා |
| 8 | සීමාරහිත හාවාඑළිය සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | නු 374 | 1988.01.14 | 2024.06.07 | බී. ජී. එස්. ඒ. මධුරංග මයා |
| 9 | සීමාරහිත අපර්කෘඩම් වල්ලිපුරම් සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | මපස 533 | 1994.03.28 | 2024.06.07 | බී. ජී. එස්. ඒ. මධුරංග මයා |
| 10 | සීමාසහිත අක්කරවත්ත වටවල රොසැල්ල කුඩාඔය ග්‍රාමසේවක කොට්ඨාසයේ කිරි නිශ්පාදන සමුපකාර සමිතිය | මපස 148 | 1991.03.01 | 2024.05.03 | බී. ජී. එස්. ඒ. මධුරංග මයා |
| 11 | සීමාරහිත කළුගල සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | මපස 529 | 1994.02.21 | 2024.08.23 | බී. ජී. එස්. ඒ. මධුරංග මයා |
| 12 | සීමාසහිත හගරාපිටිය නීලවතුරකන්ද සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | නු 386 | 1988.03.18 | 2024.06.07 | බී. ජී. එස්. ඒ. මධුරංග මයා |
| 13 | සීමාසහිත තෙරිපැහැ සිකරට් දුම්කොල කෘෂි නිශ්පාදන සමුපකාර සමිතිය | එන්ඊ 18 | 1956.11.02 | 2024.08.23 | බී. ජී. එස්. ඒ. මධුරංග මයා |
| 14 | සීමාරහිත වලපනේ රණමයුර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | මපස 750 | 2005.07.04 | 2024.06.07 | බී. ජී. එස්. ඒ. මධුරංග මයා |

**හිමිකම් ඉදිරිපත් කිරීමේ ඉල්ලුම්පත්‍රය**

01. සමිතියේ නම :.............................................................................................................................................
02. හිමිකම් ඉල්ලුම්කරුගේ නම :.........................................................................................................................
03. ලිපිනය :......................................................................................................................................................
04. සාමාජිකයෙකු නම් සාමාජික අංකය :.............................................................................................................
05. සාමාජිකත්වය ලැබුණු දිනය :........................................................................................................................
06. අයවීමට ඇති මුදල :......................................................................................................................................
07. අයවීමට ඇත්තේ කුමන කරුණක් සඳහාද යන වග :.................................................................................................
08. හිමිකම් ඉදිරිපත් කරනුයේ කවුරුන් වශයෙන් ද යන වග :.........................................................................................
(සාමාජික/නිළධාරි/සේවක/වෙනත්)
09. හිමිකම් තහවුරු කිරීමට ඉදිරිපත් කෙරෙන ලියවිලි :.................................................................................................

ඉල්ලුම්කරුගේ අත්සන :.......................................
ඈවරකරු :............................................

දිනය :........................

01-10

# තනතුරු ඇබෑර්තු

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර (මාතලේ) සඳහා පත් කිරීමට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි, සේවයේ නියුතු ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියේ (කෘෂි සංවර්ධන ධාරාවට අයත්) නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය :

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II ශ්‍රේණියට අයත් අයදුම්කරුවන් අතුරින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී, මධ්‍යම රජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබ ඇති ලකුණු පරිපාටිය අනුව ලකුණු පිරිනමා, ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

02. අවශ්‍ය වෙනත් සුදුසුකම් :

I. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ විනය කටයුත්තකට හෝ විනය දඬුවමකට භාජනය නොවූ අයෙකු විය යුතුය.

II. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් වෙතින් පමණක් අයදුම්පත් කැඳවනු ලබන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

III. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

*සටහන* : සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

03. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර **2025.01.22** වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මගින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය.) "ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර, යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පතක් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාරගනු නොලැබේ.

(ආදර්ශ අයදුම්පත්‍ර www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය.)

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර, යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2024 දෙසැම්බර් මස 24 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ***
***ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :..........................................................................................................................මයා/මිය/මෙනවිය)

02. (i) දැනට දරන තනතුර :.........................................................................................................
(ii) සේවය හා ශ්‍රේණිය :.........................................................................................................
(iii) දැනට සේවය කරන ආයතනය හා ලිපිනය :.......................................................................

03. පෞද්ගලික ලිපිනය :..............................................................................................................

04. ස්ත්‍රී/පුරුෂ භාවය :..............................................................................................................

05. (i) උපන් දිනය :.........................................................................................
(ii) 2025.01.22 දිනට වයස :.........................................................................

06. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................

07. දුරකථන අංකය : i. පෞද්ගලික :.............................. ii. රාජකාරී :................................

08. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II ශ්‍රේණියට උසස් වූ දිනය :...........................................................................

09. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II ශ්‍රේණියේ සේවා කාලය තුළ ලබා ඇති වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර :

| *සිට* | *දක්වා* | *අවුරුදු* | *මාස* | *දින* |
|---|---|---|---|---|
| .................. | ................... | ................ | ............. | ............. |
| .................. | ................... | ................ | ............. | ............. |
| .................. | ................... | ................ | ............. | ............. |

10. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2025.01.22) II ශ්‍රේණියේ සක්‍රිය සේවා කාලය -

අවුරුදු :............., මාස :..............., දින :...............,

11. රාජ්‍ය සේවයේ මුල් පත්වීමේ දින සිට 2025.01.22 දින දක්වා සේවා කාලයට අදාළ විස්තර :

| *දරන ලද තනතුර* | *අයත් සේවාව* | *ආයතනය* | *කාලය* | |
|---|---|---|---|---|
| | | | *සිට* | *දක්වා* |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12. කෘෂිකර්ම ක්ෂේත්‍රයට දක්වන ලද "කුසලතාවය" පිළිබඳ විස්තර :

(i) වාර්ෂික කාර්යය සාධන ඇගයුම :
(වෙබ් අඩවියේ පළකරන ලද ලකුණු නිර්ණායකයන්හි B. i ඡේදයේ සඳහන් පරිදි)

සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට පූර්වාසන්න වසර 05 තුළ ලබා ඇති කාර්යය සාධන මට්ටම පිළිබඳ විස්තර (අදාළ නොවන වචන කපා හරින්න) :

| *වර්ෂය* | *ලබා ඇති කාර්යය සාධන මට්ටම* |
|---|---|
| 2020 | විශිෂ්ඨ/සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/සතුටුදායක |
| 2021 | විශිෂ්ඨ/සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/සතුටුදායක |
| 2022 | විශිෂ්ඨ/සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/සතුටුදායක |
| 2023 | විශිෂ්ඨ/සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/සතුටුදායක |
| 2024 | විශිෂ්ඨ/සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/සතුටුදායක |

(ii) ප්‍රකාශන :
(වෙබ් අඩවියේ පළකරනලද ලකුණු නිර්ණායකයන්හි B. ii ඡේදයේ ප්‍රකාශන (a), (b)ලෙස කාණ්ඩගත කර ඇත.)

| *පළ කරන ලද ප්‍රකාශනය* | *අදාළ කාණ්ඩය* |
|---|---|
| | |

(iii) ප්‍රශංසා හා සම්මාන :

(*අ*) ලබා ඇති ප්‍රශංසා පිළිබඳ විස්තර -
(“පොදු 230බී“ ආකෘතිය මගින් ලබා දී ඇති ප්‍රශංසා සඳහා පමණක් මේ යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.)

| *ලබා ඇති ප්‍රශංසාව* | *ප්‍රශංසාව ලැබුණේ* | | *කුමන ක්ෂේත්‍රයට අදාළ කාර්යයක් වෙනුවෙන් ප්‍රශංසාව හිමිවූයේද යන්න* |
|---|---|---|---|
| | *කාගෙන් ද යන්න* | *වර්ෂය* | |
| | | | |

(ආ) ලබා ඇති සම්මාන පිළිබඳ විස්තර :

(වෙබ් අඩවියේ පළකරන ලද ලකුණු නිර්ණායකයන්හි B. iii ඡේදයේ ඇතුළත් වගුවේ වර්ග කර ඇති ආකාරය පදනම් කර ගෙන පහත වගුවේ සඳහන් කරන්න.)

1. කෘෂිකාර්මික අංශය වෙත දැක්වූ දායකත්වය සඳහා අන්තර්ජාතික මට්ටමේ සම්මාන - ඇත/නැත

| සම්මානයේ නම | සම්මානය පිරිනමන ලද්දේ | | කුමන ක්ෂේත්‍රයට අදාළ කාර්යයක් වෙනුවෙන් සම්මානය ලැබුණේ ද යන්න |
|---|---|---|---|
| | කවුරුන් විසින් ද යන්න | වර්ෂය | |
| | | | |

2. කෘෂිකාර්මික අංශය වෙත දැක්වූ දායකත්වය සඳහා ජාතික මට්ටමේ සම්මාන - ඇත/නැත

| සම්මානයේ නම | සම්මානය පිරිනමන ලද්දේ | | කුමන ක්ෂේත්‍රයට අදාළ කාර්යයක් වෙනුවෙන් සම්මානය ලැබුණේ ද යන්න |
|---|---|---|---|
| | කවුරුන් විසින් ද යන්න | වර්ෂය | |
| | | | |

3. කෘෂිකාර්මික අංශය වෙත දැක්වූ දායකත්වය සඳහා පළාත් මට්ටමේ සම්මාන - ඇත/නැත

| සම්මානයේ නම | සම්මානය පිරිනමන ලද්දේ | | කුමන ක්ෂේත්‍රයට අදාළ කාර්යයක් වෙනුවෙන් සම්මානය ලැබුණේ ද යන්න |
|---|---|---|---|
| | කවුරුන් විසින් ද යන්න | වර්ෂය | |
| | | | |

(i) මට විරුද්ධව දැනට විනය පරීක්ෂණයක් නොපැවැත්වෙන බවත්, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ සඳහන් I හෝ II වන උපලේඛනය යටතේ සිදුකරනු ලැබූ වරදකට දඬුවම් නොලැබූ අයෙකු බවත්, ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි ඒවා බවත්, මෙයින් සහතික කරමි.

............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :....................

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :**

ඉහත සඳහන් තොරතුරු ඉදිරිපත් කර ඇති ......................................................... නිලධාරියාගේ/නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒ අනුව එම තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම නිලධාරියා/නිලධාරිනිය විසින් 2025.01.22 දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාව තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභා

චක්‍රලේඛ අංක 01/2020 හා 01/2020 (I) හි සඳහන් ආකාරයේ කිසිදු විනයානුකූල දඬුවමකට ලක් නොවූ බවත්, මෙම අයට විරුද්ධව යම් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් හා ඉදිරියේ දී එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් නොකරන බවත් සහතික කරමි. නිලධාරියා/නිලධාරිනිය තෝරාගනු ලැබුවහොත් නිදහස් කිරීමට එකඟ වෙමි.

දිනය :...........................

........................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
නම :....................................................
නිල මුද්‍රාව :...........................................

---

**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :**

දිනය :...........................

...............................................,
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන.
නම :....................................................
නිල මුද්‍රාව :...........................................

---

**පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :** (පළාත් සභාවට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් සඳහා පමණි.)

දිනය :...........................

.................................................,
පළාත් ප්‍රධාන ලේකම්ගේ අත්සන.
නම :....................................................
නිල මුද්‍රාව :...........................................

01-30

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2025.01.03 | සිකුරාදා | 2024.12.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.10 | සිකුරාදා | 2024.12.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.17 | සිකුරාදා | 2025.01.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.24 | සිකුරාදා | 2025.01.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.31 | සිකුරාදා | 2025.01.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2025.02.07 | සිකුරාදා | 2025.01.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.14 | සිකුරාදා | 2025.01.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.21 | සිකුරාදා | 2025.02.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.28 | සිකුරාදා | 2025.02.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2025.01.07 | සිකුරාදා | 2025.02.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.14 | සිකුරාදා | 2025.02.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.21 | සිකුරාදා | 2025.01.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.28 | සිකුරාදා | 2025.01.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2025 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.